35 වන පිටෙන්




හේතුවක් නිසා අපට දින දෙකක් ආහාර එව්වේ නැත. ඉතාමත් දුෂ්කර වූ බංකර ඉදිකිරීම් කාර්යෙහි යෙදුණු සටන්කාමියෝ මහත් හාමතට පත්ව වුන්හ. එය තල්ගෙඩි ඉදී බිමට වැටෙන කාලයයි. අපි අසළ වූ වතුවලට ගොස් තල් ගෙඩි අහුලා යුෂ උරා බීවෙමු. දෙවෙනි දින මධ්‍යාහ්නයේදී කුඩා බාල්දියකට ආහාර එවා තිබුණි. දරාගත නොහැකි කුස ගින්නක සිටි අය එම බාල්දියෙහි ප්‍රමාණය දුටු විගසම අඬන්නට වූහ. එම ආහාර ප්‍රමාණය දස දෙනෙකුට පවා නොසෑහෙයි. එම ආහාර ප්‍රමාණය එකට අනා එක් අයෙකු එක ගුලිය බැගින් අනුභව කළාය.

සියල්ලම එකතුව හය මසක පුහුණුව අවසන් කළ පසුව නැවතත් මා දේශපාලන කටයුතු සඳහාම යැවිණි. මගේ නැගණිය 'දිවි' බළ සේනාවට යැව්වාය. ඊට පසු මට මගේ නැඟණිය දැකගැනීමට ලැබුණේ අවුරුදු තුනකට පමණ පසුවය. මා සමඟ පුහුණුව ලැබූ යෙහෙළියන් සටන් පෙරමුණේ දී වීර මරණය වැළඳගත් පුවත් මට ආරංචි වන විට ඔවුන් සමඟ මමද යුද්ධ බිමට යා යුතුය යන හැඟීම මගේ සිත වේදනාවට ලක් කළේය. යාපනය ප්‍රධාන මධ්‍යස්ථානයේ සිට දේශපාලන අංශයට අයත් සටන්කාමී සහෝදර සහෝදරියන්ව වැඩ කටයුතු සඳහා බෙදා වෙන්කර යවමින් තිබිණ. මා තනියම කැඳවූ වගකීම් බාර සහෝදරිය ගොවිපළක වගකීම බාර ගැනීමට යන මෙන් මා වෙත දැනුම් දුන්නාය.

කොටි සංවිධානය විසින් නීති පරිපාලන අංශය 1991 වසරේදී ආරම්භ කර තිබුණි. එහෙත් උසාවි ආරම්භ කර තිබුණේ නැත. එමෙන්ම සංවිධානයේ පොලිසියද තම කටයුතු ව්‍යාප්ත කර තිබුණේ නැත. සමාජයේ සිදු කෙරෙන අපරාධ පිළිබඳව පරීක්ෂණ පවත්වා තීන්දු දීම සිදුකරන ලද්දේ එම ප්‍රදේශයේ දේශපාලන අංශය බාර වගකීම් දරන්නා විසිනි. සමහර අපරාධවලට සම්බන්ධව දඬුවමට ලක්වූ කාන්තාවන්ව රඳවා තැබීම සඳහා මෙම ගොවිපලවල් සාදා තිබුණි. පුන්නා ලකෙකට්ටුවන් 'මග්නන් ෆාම්' නමින් හැඳින්වූ ගොවිපොළට අයත් විශාල භූමිය කාන්තාවන් සඳහා වන පරිවාස කඳවුර ලෙසින් විමුක්ති කොටි සංවිධානයේ කාන්තා පෙරමුණ විසින් පාලනය කරන ලදි. මා යැව්වේ එම ස්ථානයෙහි වගකීම පවරාය. පරිවාසික කඳවුරට මම වගකීම භාරගෙන යනවිට එහි කාන්තාවෝ තිස් දෙනෙකු පමණ උන්හ. විමුක්ති කොටි සංවිධානය විවිධ චෝදනා යටතේ ඔවුන්ව රඳවාගෙන උන්නේය. කොටි සංවිධානයේ ප්‍රාදේශීය වගකීම් භාරකරුවන් විසින් වැරදිකාරියන් ලෙස විනිශ්චයට ලක් කරනු ලැබ සිටි ඔවුන් නීති පරිපාලන අංශය විසින් නඩු අසා දඬුවම් කාලය තීරණය කරනු ලැබ සිරකාරියන් ලෙස එහි එවා තිබුණි. කසිප්පු පෙරීම, සොරකම් කිරීම, ගබ්සා කිරීම, ලිංගික වෘත්තිය යනාදී වශයෙන් ඔවුහු විවිධ චෝදනාවන්ට ලක්වූ අය වූහ. සශ්‍රික වූ රතු පැහැති පසක් සහිත එම විශාල ගොවිපළෙහි ඔවුන් සඳහා වැඩ කටයුතු පවරා තිබුණි. මම වගකීම භාරගෙන ගිය පසුව ඔවුන් සමඟ තනි තනිවම විවෘතව කතා බහේ යෙදුණෙමි. සමාජය විසින් වසා දමනු ලබන මිනිස් හැඟීම් ද, කාන්තාවන්ව පමණක් අපරාධකාර තත්ත්වයට පත් කරවන අපේ සමාජයේ ආකල්පද මාව කම්පනයට පත් කළේය. සමාජයේ කාන්තාවන්ගේ ප්‍රශ්න පිළිබඳව ගැඹුරින් තේරුම් ගැනීමට ආරම්භක පාඩම් බවට පත්වූයේ එම කාන්තාවන්ගේ කඳුළු කතාය.

මගේ පවුල ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුලක් වුවත් ගොඩ ගොවිතැන පිළිබඳව මම එතරම් දැනගෙන නොසිටියෙමි. එහෙයින් මම ඉනුවිල් ප්‍රදේශයෙහි වාසය කළ කෘතහස්ත ගොවි වැඩිහිටියෙකු හමුවී ඔහුගේ උපදෙස් ලබා ගැනීමට පටන් ගත්තෙමි. ඔහු තම විවේක කාලය මහත් උනන්දුවකින් යුතුව අපේ ගොවිපළෙහි ගත කිරීමට පටන් ගත්තේය. එක් එක් භෝග වර්ගය වගා කළ යුතු කාලය පිළිබඳවත්, ජලය සපයන කානු පද්ධතිය සකස් විය යුත්තේ කෙසේද?, භාවිත කළ යුතු පොහොර සහ රසායනික ද්‍රව්‍ය මොනවාද?, යන්න පිළිබඳවත් ඔහු ගොවිපළේ දී කාන්තාවන්ට ඉගැන්නුවේය. අදහාගත නොහැකි තරමට ගොවිතැන සරුවිය. එමෙන්ම කාන්තාවන් ද වගා කිරීම පිළිබඳ පුහුණුව යහපත් මට්ටමකට ලබා ගත්හ. අස්වැන්න තොග වශයෙන් චුන්නාකම් වෙළඳපොළේ අලෙවි කළෙමු. එම ආදායමෙන් ගොවිපොළේ සිටින අයගේ අවශ්‍යතාවන් සම්පූර්ණ කළ යුතු යැයි මා වෙත දැනුම් දී තිබුණි. කාන්තා පෙරමුණෙහි මූල්‍ය අංශයට මම ගණන් හිලව් ඉදිරිපත් කළ යුතුය. පරිවාසික කඳවුරෙන් පිටවෙන කාන්තාවන්ට උදව් කළ යුත්තේ ද එම ආදායමින්ය. මාස තුනක්, මාස හයක් ආදී වශයෙන් නියමිත දඬුවම් කාලය අවසන් වූ පසුව ජීවනාධාරයක් ලෙසින් රුපියල් පන්දාහක මුදලක් ද, හාල් පිටි සීනි පරිප්පු වශයෙන් කිලෝ විසිපහක බරකින්ද යුත් ආහාර ද්‍රව්‍ය පාර්සලයක් ද සහිතව නිවෙස්වලට යැව්වේය.

එම කාන්තාවන් පරිවාසික කඳවුරෙහි රැඳී සිටින කාලය තුළ දී ඔවුන්ගේ පවුල්වලට මාසයකට වතාවක් ගොස් නිරීක්ෂණය කර කාන්තා පෙරමුණේ වගකීම භාර සහෝදරියට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ඒවා විශේෂයෙන්ම ළමුන්ගේ අවශ්‍යතා වන අතර ප්‍රදේශය භාර වගකීම දරන අයගේ අවධානයට යොමුකර වහාම සම්පූර්ණ කළ යුතුය. එමෙන්ම එම කාන්තාවන් නිදහස් වී නිවෙසට ගිය පසුවත් අඛණ්ඩව මාස තුනක් ඔවුන්ගේ ජීවන ප්‍රගතිය නිරීක්ෂණය කර අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. ඇත්තෙන්ම මෙම කටයුතු සිදු කිරීම සඳහා යෙදූ සාමාජිකාවන් සිව්දෙනාට පාපැදි හතරක් හැර වෙනත් කිසිම පහසුකමක් තිබුණේ නැත. වඩමාරච්චියටත් තෙන්මාරච්චියටත් යන මාර්ග සහ විවෘත තැනිතලා බිම් සිසාරා හමන දැඩි සුළං නිසා ඔවුන්ට පාපැදි ධාවනය කිරීමට සිදුවූයේ අධික වෙහෙසක් දරමිනි. මෙකී කාල වකවානුව වන විට කාන්තා බල සේනාවේ දෙවන පෙළේ සෙන්පති පදවිය දැරුවේ විදූෂාය. සටන්කාමී සහෝදරියන්ගේ පුද්ගලික ප්‍රශ්න විසඳීම සහ දරන පරිපාලන වගකීම වෙනස් කිරීමේ තීරණ ඇය සතු විය. පුන්නාලෙක්කට්ටුවන් පරිවාස කඳවුරට පැමිණි ඇය මහත් පුදුමයෙන් යුතුව අපි එහි සිදුකරමින් පවතින වැඩ කටයුතු දැක ප්‍රශංසාවට ලක් කළාය.

1993 වසරේ අප්‍රේල් මාසයේදී මා යාපනය දිස්ත්‍රික්කයෙහි වලිකාමම් කොට්ඨාශයෙහි කාන්තා අංශ භාරකාරිය ලෙසට පත් කළේය. අපගේ දේශපාලන කඳවුර පිහිටියේ උඟරෙළු ගමෙහිය. එහි මා සමඟ සටන්කාමී සහෝදරියෝ විසි දෙනෙකු උන්හ. ඔවුන් අතරින් සංවිධානයේ අත්දැකීම් අඩු තැනැත්තිය වූයේ මාය. එහෙයින් ආරම්භයේදී මම ඔවුන්ගේ මාර්ගයෙන් වැඩ කටයුතු ඉටු කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව කැළඹිල්ලට පත්ව සිටියෙමි. එහෙත් දින කිහිපයක් ගතවෙත්ම එය මට දුෂ්කර කාර්යයක් නොවීය.

**මතු සම්බන්ධයි**


Custom Built Kitchens for Affordable Prices

FREE QUOTE



- NEW KITCHEN OR RENOVATE OLD ONE
- WARDROBE
- PANTRY
- NEW OVER HEAD CUPBOARDS FOR LAUNDRY





Auska ROUTING PTY LTD

Fact. 10, 3-11 Bate Close
Pakenham VIC 3810
Ph: 03 5940 4629
Info@auskarouting.com.au
www.auskarouting.com.au

CONTACT
LEELANANDA GALAPPATHTHI 0429 183 974

සන්නස වෙළඳ දැන්වීම්
Sannasa Advrvertising

එස් ජයසිංහ / S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

අසෝක සුබසිංහ / Asoka Subasinghe 0432 391 922
email - sannasanews@gmail.com

JAPANESE
By a qualified experienced teacher with proven results

PREP to VCE

- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University), B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.

Contact Number: 0425 396 975